SI

# Seven & i හෝල්ඩින් සමාගමේ ව්‍යාපාර හවුල්කරුවන් සඳහා වන තිරසාර ක්‍රියාකාරී මාර්ගෝපදේශය

## I. හැඳින්වීම

- **සීමාසහිත Seven & i හෝල්ඩින් හා එහි ඒකාබද්ධ අනුබද්ධිත සමාගම් (මින් ඉදිරියට "සමූහය" ලෙස හැඳින වේ) සමාගමේ මෙහෙවර ප්‍රකාශය මත පදනම්ව අවංකව කටයුතු කරන අතර තිරසාර සමාජයක් සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වන්නෙමු.**

  සමාගම් මෙහෙවර ප්‍රකාශය
  අප සමාගමේ ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය දිනාගනිමින් අවංක සමාගමක් වීමට අවශ්‍යයි.
  අප සමාගමේ ව්‍යාපාරික හවුල්කරුවන්, කොටස් හිමියන් සහ ප්‍රාදේශීය ප්‍රජාව විසින් විශ්වාස කරනු ලබන අවංක සමාගමක් වීමට අවශ්‍යයි.
  අප සමාගමේ සේවකයින්ගේ විශ්වාසය දිනාගත් අවංක සමාගමක් වීමට අවශ්‍යයි.

- **අප සමූහය, සියලුම පුද්ගලයන්ගේ මානව හිමිකම් වටහා ගෙන ඒවාට ගරු කිරමින් අපගේ වගකීම ඉටු කිරීම සඳහා, මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර මූලධර්ම සහ ප්‍රමිතීන් මත පදනම්ව " Seven & i හෝල්ඩින් සමාගම් මානව හිමිකම් ප්‍රතිපත්තිය" ස්ථාපිත කර ඇත්තෙමු.**

  මෙම ප්‍රතිපත්තිය සියලුම නිලධාරීන්ට සහ සේවකයින්ට අදාළ වන අතර, මෙම ප්‍රතිපත්තිය ආරක්ෂා කර ගැනීමටත් මානව හිමිකම්වලට ගරු කිරීම සඳහා එක්ව කටයුතු කිරීමටත් අපි සියලුම ව්‍යාපාරික හවුල්කරුවන් දිරිමත් කිරීම දිගටම කරගෙන යන්නෙමු.

- **අප සමූහය අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ අන්‍යෝන්‍ය සමෘද්ධිමත් සබඳතා ගොඩනඟා ගන්නා අතර " 2030 තිරසාර සංවර්ධනය සඳහා වූ න්‍යාය පත්‍රයේ (කිසිවෙකු මග නොහැරෙනු ඇත )" යන දර්ශනයට දායක වේ.**

  අප අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ එක්ව, "මානව හිමිකම් වලට ගරු කිරීම", "ගෝලීය පරිසර සංරක්ෂණය", "නීති සහ රෙගුලාසි පිළිපැදීම" ප්‍රවර්ධනය කර, තිරසාර සමාජයක් සාක්ෂාත් කර ගැනීමට දායක වන්නෙමු.
  අප අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ එක්ව, "ආරක්ෂිත සහ සුරක්ෂිත නිෂ්පාදන සහ සේවා" සැපයීමෙන් සෞඛ්‍ය සම්පන්න සහ සමෘද්ධිමත් අනාගතයක් නිර්මාණය කරන්නෙමු.
  අප අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ එක්ව, සමාජ බැහැර කිරීමට තුඩු දෙන සමාජ ගැටළු විසඳා කිසිවෙකු බැහැර නොකරන සමාජ ඇතුළත් කිරීම් ප්‍රවර්ධනය කරන්නෙමු.

## II. “Seven & i හෝල්ඩින් සමාගම් ව්‍යාපාර හවුල්කාරීත්ව තිරසාර ක්‍රියාකාරී මාර්ගෝපදේශය” ක්‍රියාත්මක කිරීම

**“Seven & i හෝල්ඩින් සමාගම් ව්‍යාපාර හවුල්කාරීත්ව තිරසාර ක්‍රියාකාරී මාර්ගෝපදේශය” වටහාගෙන ඒවා පිළිපදින ලෙස සියලුම ව්‍යාපාරික හවුල්කරුවන්ගෙන් ඉල්ලා සිටිමු.**

1. ව්‍යාපාරික හවුල්කරුවන් Seven & i හෝල්ඩින් සමාගම් ව්‍යාපාර හවුල්කාරීත්ව තිරසාර ක්‍රියාකාරී මාර්ගෝපදේශය (මින් ඉදිරියට ව්‍යාපාර හවුල්කාරීත්ව ක්‍රියාකාරී මාර්ගෝපදේශය ලෙස හැඳින්වේ) වටහාගෙන ඒවා පිළිපදින ලෙසත්, Seven & i අප සමූහය විසින් හසුරුවන නිෂ්පාදන පිළිබඳව සැපයුම්කරුවන්ට දැනුම් දෙන ලෙසත් අපි ඉල්ලා සිටිමු.
2. ව්‍යාපාර හවුල්කාරීත්ව ක්‍රියාකාරී මාර්ගෝපදේශය පිළිපැදීම සම්බන්ධව, අවශ්‍ය වූ විට Seven & i අප සමූහය සමඟ තොරතුරු හුවමාරු කරගැනීමටද සහය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමු.
3. පුද්ගලික හානි වලට හේතු වන අනතුරු, මානව හිමිකම් උල්ලංඝනය කිරීම් හෝ නීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීම් වැනි මෙම මාර්ගෝපදේශවල කිසියම් බරපතල උල්ලංඝනයක් තහවුරු වුවහොත්, වහාම සෑම Seven & i අප සමූහ මෙහෙයුම් සමාගමකම කාර්යභාර පුද්ගලයාට ඒ බව වාර්තා කර, ගැටලුවේ අවදානම් මට්ටම අනුව හානිය පැතිරීම වැළැක්වීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ සහ ප්‍රතිකර්ම පියවර ගන්න. එසේම එසේ වීමට හේතුව හඳුනාගෙන නැවත ඇතිවීම වැළැක්වීමට පියවර ගන්න.
4. ඔබේ ව්‍යාපාර කටයුතුවල තිරසාරභාවය පිළිබඳ අවදානම් තක්සේරු කර, ඍණාත්මක බලපෑමක් ඇති කිරීමේ වැඩි අවදානමක් ඇති ක්ෂේත්‍ර කෙරෙහි ප්‍රමුඛත්වය දීමට සහ අවධානය යොමු කරන්න.
5. ව්‍යාපාරික හවුල්කරුවන්, ව්‍යාපාර හවුල්කාරීත්ව ක්‍රියාකාරී මාර්ගෝපදේශයෙහි අන්තර්ගතයන් ඇතුළත් ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම, සමාගම තුළ සහ පිටත ඒවා ඉදිරිපත් කිරීම, පුහුණු ආදී දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් පැවැත්වීම සහ මෙම ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම සඳහා සංවිධානයක් සංවර්ධනය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරන්න. ගැටළු හඳුනා ගැනීම සඳහා ඔබේ සංවිධානයේ තත්ත්වය නිතිපතා සමීක්ෂණය කර, එම ගැටළු නිවැරදි කර සහ පිළියම් සපයා නැවත ගැටළු ඇතිවීම වැළැක්වීමට පියවර ගන්න.
6. මානව හිමිකම් හෝ නීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීම් වැනි මෙම මාර්ගෝපදේශ උල්ලංඝනය කරන ඕනෑම බරපතල ක්‍රියාවක් තහවුරු වුවහොත්, අපි ඔබ සමඟ ව්‍යාපාර කටයුතු තාවකාලිකව අත්හිටුවීමට හෝ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට සිදුවන අවස්ථාද පවතී. එවැනි අවස්ථාවකදී කිසියම් හානියක් සිදු වුවද, අපගේ සමාගම හෝ Seven & i අප සමූහයේ කිසිදු මෙහෙයුම් සමාගමක් කිසිදු වන්දියක් හෝ වන්දි මුදලක් ලබා නොදෙනු ඇත.

## III. Seven & i හෝල්ඩින් සමාගමේ ව්‍යාපාර හවුල්කරුවන් සඳහා වන තිරසාර ක්‍රියාකාරී මාර්ගෝපදේශය

### 1. නීති හා රෙගුලාසි පිළිපැදීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අවනත වීම

1. සියලුම රටවල්වල සහ කලාපයන්හි නීති සහ රෙගුලාසි මෙන්ම අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ එම මූලධර්ම පිළිපදින්න.
2. නීති සහ රෙගුලාසි පිළිපැදීම සඳහා ප්‍රතිපත්ති සැකසීම, පද්ධති ගොඩනැඟීම , අධ්‍යාපනයක් ලබාදීම, අභ්‍යන්තර වාර්තාකරණ පද්ධතියක් ආදිය ස්ථාපිත කරන්න.

## 2. මානව හිමිකම්වලට ගරු කිරීම

**සියල්ලටම ප්‍රමුඛත්වය ලබා දී, ඔබේ ව්‍යාපාරික කටයුතුවලට සම්බන්ධ සියලු පුද්ගලයන්ගේ මානව හිමිකම්වලට ගරු කරමින් හා ආරක්ෂා කරමින්විශ්වාසනීය සබඳතා ගොඩනඟා ගනිමින්, ඵලදායිතාව වැඩි දියුණු කිරීමට උත්සාහ කරන්න.**

1. ජාත්‍යන්තරව ප්‍රකාශයට පත් කරන ලද "ජාත්‍යන්තර මානව හිමිකම් පනත" සහ "ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) මූලික මූලධර්ම සහ රැකියා ස්ථානයේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය"ට ගරු කරන්න. තවද, සියලුම රටවල්වල සහ කලාපයන්හි නීති සහ රෙගුලාසි මඟින් මානව හිමිකම් ප්‍රමාණවත් ලෙස ආරක්ෂා නොකරන අවස්ථාවකදී වුවද, මෙම ප්‍රකාශන මත පදනම්ව මානව හිමිකම්වලට ගරු කිරීමට උත්සාහ කරන්න.
2. මානව හිමිකම් උල්ලංඝනය කිරීම සඳහා සෘජුව හෝ වක්‍රව දායක නොවන්න.
3. ව්‍යාපාරික හේතූන් මත,මානව හිමිකම්වලට ගරු කිරීම සහ ආරක්ෂා කිරීම නොසලකා හැරීම සිදු නොකරන්න.
4. මානව හිමිකම් උල්ලංඝනයක් හඳුනාගතහොත්, එය නිවැරදි කිරීමේ පියවර ක්‍රියාත්මක කරන්න.
5. මානව හිමිකම්වලට ගරු කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, පද්ධති ගොඩනැඟීම, අධ්‍යාපනය ලබා දීම සහ අභ්‍යන්තර වාර්තාකරණ පද්ධති ආදිය ස්ථාපිත කරන්න.

## 3. ළමා ශ්‍රමය තහනම් කිරීම සහ තරුණ ශ්‍රමිකයන් ආරක්ෂා කිරීම

**සෞඛ්‍ය සම්පන්න සමාජ සංවර්ධනයක් සහ තිරසාර සමාජයක් සඳහා දරුවන්ට අධ්‍යාපනය අත්‍යවශ්‍ය වන අතර, එම අවස්ථාවට බාධා කරන ළමා ශ්‍රමය ලබා ගැනීම තහනම් කරන්න. තවද, තරුණ සේවකයින්ට තවමත් සමාජයට අනුවර්තනය වීමේ අත්දැකීම් අවම බැවින් ඔවුන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දෙන්න.**

1. සේවකයින් සේවයේ යෙදවීමේදී, සෑම කෙනෙකුගේම වයස් ප්‍රභේද තහවුරු කිරීමට වග බලා ගන්න.

2. ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) විසින් ස්ථාපිත කර ඇති දේශීය නීති සහ රෙගුලාසි සහ සම්මුතීන් උල්ලංඝනය කරමින් ළමා ශ්‍රමිකයින් සේවයේ යෙදවීමෙන් වළකින්න.
*ILO සම්මුතියේ සඳහන් වන්නේ සේවකයින් සඳහා වන අවම වයස අනිවාර්ය අධ්‍යාපනය සම්පූර්ණ කරන වයසට වඩා අඩු නොවිය යුතු බවත් එය සෑම අවස්ථාවකදීම වයස අවුරුදු 15 හෝ ඊට වඩා වැඩි විය යුතු බවයි. (කෙසේ වුවද, අනතුරුදායක කටයුතු  සඳහා, සියලුම රටවල වයස් සීමාව අවුරුදු 18 හෝ ඊට වැඩි වන අතර, සංවර්ධනය වෙමින් පවතින රටවල සංක්‍රාන්ති කාල පරිච්ඡේදයක් තුළ අවුරුදු 14 හෝ ඊට වැඩි කාලයක් හැර, සැහැල්ලු වැඩ සඳහා ව්‍යතිරේක පවතී.)
3. වයස අවුරුදු 18 සම්පූර්ණ නොවූ  කිසිඳු පුද්ගලයෙකුට රාත්‍රියේ හෝ අනතුරුදායක තත්වයන් යටතේ වැඩ කිරීමට ඉඩ ලබා නොදෙන්න.
4. ළමා ශ්‍රමය යොදාගන්නා බවට අනාවරණය වුවහොත්,එම දරුවන්ගේ ආරක්ෂාකාරී බව තහවුරු කර,අවශ්‍ය සහය සහ මුදවා ගැනීමේ පියවර ක්‍රියාත්මක කරන්න.

## 4. බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තහනම් වේ

**සේවකයින් විසින් ස්වේච්ඡාවෙන් වැඩ කටයුතු කරගෙන යා යුතු අතර, බලහත්කාරයෙන් ඔවුන්ගේ ශ්‍රමය ලබා නොගත යුතුය. මෙහිදී තහනම් ලෙස හඳුන්වනු ලබන්නේ, දඬුවම් කරන බවට තර්ජනය කර යමෙකු මත බලහත්කාරයෙන් පටවන ලද කාර්යයන්  පමණක් නොව, ස්වකීය  කැමැත්තෙන් සිදු නොකරන කාර්යයන්  හෝ සේවාවන් ද ඇතුළත් වේ.**

1. බලහත්කාරයෙන්, බැඳ දමා හෝ බලහත්කාරී ලෙස වහල්භාවයට පත් කිරීම තහනම් වේ.
2. සේවකයින් සහ රැකියා සොයන්නන්ගෙන් මූල්‍ය තැන්පතුවක් හෝ හැඳුනුම්පත් ලේඛන ලබා දෙන ලෙස ඉල්ලා නොසිටින්න. රැකියා ඒජන්සියක් භාවිතා කරන විට, එම ආයතනය සේවකයින්ට සහ රැකියා සොයන්නන්ට මූල්‍ය තැන්පතු හෝ මුල් හැඳුනුම්පත් ලේඛන තැන්පත් කිරීමට බල කිරීම වැනි බඳවා ගැනීමේ පිළිවෙත්වල නිරත නොවන ලෙසට වග බලා ගන්න.
3. සේවා ස්ථාන පහසුකම්වල, සේවකයින්ට නිදහසේ ගමන් කිරීමට අසාධාරණ සීමාවන් නොපැනවිය යුතු අතර, කැමරා සවි කිරීම සහ ආරක්ෂකයින් යෙදවීම ආදිය අපරාධ වැළැක්වීම, තොරතුරු කළමනාකරණය සහ වෘත්තීය ආරක්ෂණ කළමනාකරණය යනාදිය සඳහා විය යුතු අතර, ඒවා සේවකයින් නිරීක්ෂණය කිරීමේ අරමුණින් භාවිතා නොකරන්න.
4. සේවකයින්ට ඔවුන්ගේ නියමිත වැඩ කාලයෙන් පසු සමාගමෙන් පිටත්ව යාමට නිදහස ඇති අතර, ඔවුන්ගේ කැමැත්තකින් තොරව අතිකාල වැඩ කිරීමට ඔවුන්ට බල නොකළ යුතුය.
5. ඉල්ලා අස්වීම ස්වේච්ඡාවෙන් සිදු කිරීමට වග බලාගන්න.

## 5. සේවයේ යෙදවීම සහ සේවක ආරක්ෂාව

**ආයතනික ක්‍රියාකාරකම්වල නියැලී සිටින පුද්ගලයින් සාධාරණ ලෙස සේවයේ යොදවා, ඔවුන්ගේ මානව හිමිකම්, ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳව සැලකිලිමත් වන්න. ඔවුන්ට සනීපාරක්ෂක, ක්‍රියාකාරී, ප්‍රතිලාභදායක සහ මානුෂීය වැඩ සහ පරිසරයන් ලබා දෙන්න.**

1. සේවකයින් සේවයේ යෙදවීමේදී ගැනීමේදී, දේශීය නීති සහ රෙගුලාසි මත පදනම් වූ සුදුසු කම්කරු ගිවිසුමකට එළඹෙන විට සේවකයින් සමඟ ඔවුන්ගේ මව් භාෂාවෙන් හෝ ඔවුන්ට තේරුම් ගත හැකි භාෂාවකින් සිදු කරන්න.
2. රැකියා කොන්දේසි පිළිබඳ තොරතුරු පහසුවෙන් තේරුම් ගත හැකි වන සේ පැහැදිලිව ලියා, එය ඕනෑම විටෙක පරිශීලනය කල හැකි බව සහතික කර ගන්න.
3. ඔබ සංක්‍රමණික සේවකයින් සේවයේ යොදවන්නේ නම්, ඔවුන් තම මව් රටින් පිටවීමට පෙර ඔවුන්ට රැකියා කොන්දේසි ලබා දෙන්න.
4. වැඩ කරන පැය ගණන ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) විසින් නිර්දේශ කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව සකසා ගන්න.

   *ILO "වැඩ කරන පැය ගණන අඩු කිරීම පිළිබඳ නිර්දේශය” 1962 වර්ෂය

   - සතියකට පැය 40ක් වන මූලධර්මය සමාජ සම්මතයක් ලෙස ක්‍රමානුකූලව සාක්ෂාත් කර ගැනීම.
   - වැඩ කරන පැය ගණන අඩු කරන විට, සේවකයින්ගේ වැටුප් අඩු නොවීම.
   - සාමාන්‍ය වැඩ කරන පැය ගණන වර්තමානයේ සතියකට පැය 48කට වඩා වැඩි නම්, ඒවා පැය 48 දක්වා අඩු කිරීමට වහාම පියවර ගත යුතුය.
5. සේවකයින්ට ඔවුන්ගේ අදාළ රටවල නීතිවලට අනුකූලව ප්‍රමාණවත් නිවාඩු කාලයක් ගත කිරීමට ඉඩ ලබා දෙන්න. තවද, සෑම දින හතකට වරක් අවම වශයෙන් එක් දිනක් නිවාඩු ලෙස සහතික කරන්න.
6. දේශීය නීති සහ රෙගුලාසි වලට අනුකූලව, සේවකයින්ට තමන් කැමති වෘත්තීය සමිති පිහිටුවා ගැනීමට සහ ඒවාට සම්බන්ධ වීමට හැකි වන ලෙස ඉඩ ලබා දෙන්න.
7. කම්කරු සංගම් සංවිධානය කිරීම සහ සම්බන්ධ වීම වැනි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සහ රැකියා කැඳවීම්, උසස්වීම්, සේවයෙන් පහ කිරීම් හෝ රැකියා ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී වෙනස්කම් කිරීම තහනම් කරන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කරන්න.
8. සේවා යෝජකයින්, වෘත්තීය සමිති සහ සේවකයින්ගේ නියෝජිතයින් යන පාර්ශව තුනටම සතුටුදායක ලෙස එකඟතාවයකට පැමිණීම සඳහා ගැටළු සාකච්ඡා කර, සෞඛ්‍ය සම්පන්න කම්කරු-කළමනාකරණ සබඳතා ගොඩනගා ගන්න.

## 6. ජීවන වැටුප් ගෙවීම

**තෘප්තිමත් රැකියාවක් සැපයීමට සහ සේවකයින්ගේ සෞඛ්‍ය සම්පන්න සහ සංස්කෘතික ජීවිතවලට සහාය වන වැටුප් ගෙවීමට උත්සාහ කරන්න. ජීවන වැටුපක් ගෙවා ළමා ශ්‍රමය තුරන් කිරීමට සහ සමාජ ස්ථාවරත්වය පවත්වාගෙන යාමට දායක වන්න**.

1. වැටුප් දේශීය නීති හෝ රෙගුලාසි හෝ ඔබේ කර්මාන්තය විසින් ස්ථාපිත කර ඇති අවම වැටුපට වඩා අවම වශයෙන් ඉහළ වැටුපක් ගෙවන්න.
2. සියලු රටවල්වල සහ කලාපයන්හි ජීවන තත්ත්වය සපුරාලීම සඳහා අභිමත ආදායමක් ලබා දී, ආහාර, ජලය, නිවාස, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා ඇතුළුව ප්‍රමාණවත් ජීවන තත්වයක් පවත්වා ගැනීම සඳහා වන වියදම් ආවරණය කරගත හැකි ජීවන වැටුපක් ගෙවීමට උත්සාහ කරන්න.

3. අතිකාල දීමනා නීත්‍යානුකූලව නියම කර ඇති අනුපාතයට හෝ ඊට වඩා වැඩියෙන් ගෙවන්න.
4. නීත්‍යානුකූලව නියම කර ඇති සියලුම දීමනා සහ ප්‍රතිලාභ ලබා දෙන්න.
5. වැටුප් ගෙවීම් කරන සෑම අවස්ථාවකම, ආවරණය වන කාල සීමාව සහ වැටුප් විස්තරය ඔවුන්ට දැනුම් දීමට වග බලා ගන්න.
6. වැටුප් නිවැරදිව ගණනය කර ඒවාට හේතු පැහැදිලිව සඳහන් කරන්න.

## 7. හිරිහැර කිරීම, අපයෝජනය, වෙනස් කොට සැලකීම සහ අමානුෂික සැලකීම තහනම්ය

**හිරිහැර කිරීම, අපයෝජනය, වෙනස් කොට සැලකීම සහ අමානුෂික ලෙස සැලකීම තහනම් කර, ගෞරවනීය සහ ප්‍රතිලාභදායක වැඩ පරිසරයක් නිර්මාණය කිරීම ප්‍රවර්ධනය කරන්න. වෙනස් කොට සැලකීම අසාධාරණ ලෙස පුද්ගලයන්ට රැකියා අවස්ථා අහිමි කරනවා පමණක් නොව ඔවුන්ගේ මූලික මානව හිමිකම් උල්ලංඝනය කරයි. මෙය ඔවුන්ට සමාජයට ගෙන ඒමට හැකිව තිබූ බොහෝ දායකත්වයන් සහ මානව සම්පත් ද ප්‍රතික්ෂේප කරන අතර එමඟින් දැවැන්ත සමාජීය හානි සිදු වේ.**

1. ශාරීරික හෝ මානසික හිරිහැර හෝ හිරිහැර කිරීමේ තර්ජන, ලිංගික සහ බලය මත පදනම් වූ වෙනත් හිරිහැර තහනම් කර ඒවා වැළැක්වීමේ පියවර ක්‍රියාත්මක කරන්න.
2. බඳවා ගැනීම්, වැටුප්, උසස්වීම්, ස්ථාන මාරු, පුහුණුව සහ සේවයෙන් පහ කිරීම/විශ්‍රාම ගැනීම සම්බන්ධයෙන්, ජාතිය, සමේ වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, දේශපාලන අදහස්, උපන් ස්ථානය, සමාජ සම්භවය, වයස, ආබාධිතභාවය, බෝවන රෝග ආසාදනය, කම්කරු සංගම් සාමාජිකත්වය, ලිංගික දිශානතිය, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය යනාදිය මත පදනම් වූ වෙනස්කම් කිරීම තහනම් කර, සමාන අවස්ථා සහතික කරන්න.
3. හිරිහැර කිරීම, අපයෝජනය, වෙනස් කොට සැලකීම හෝ අමානුෂික සැලකීම ආදිය අනාවරණය වූ විට, එම තත්ත්වයට පිළියම් යෙදීමට පියවර ගන්න.
4. මූල්‍ය දඬුවම් දේශීය නීතියෙන් අවසර දී ඇති සීමාවන්ට අනුව සිදු කරන්න. විනය ක්‍රියා පටිපාටි සහ දඬුවම් නීතියෙන් අවසර දී ඇති සීමාවන් තුළ සහ සේවකයින්ගේ ජීවිතවලට බාධාවක් නොවන පරිදි සකසන්න. වැඩ නීති ආදියෙහි ඒවා පැහැදිලිව සඳහන් කර, සෑම කෙනෙකුම ඒවා පිළිබඳව දැනුවත් කරන්න.

## 8. වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය

**ආරක්ෂාව සහ සෞඛ්‍යය ස්වාධීනව කළමනාකරණය කිරීම දිගටම පවත්වාගෙන යමින්, කාර්මික අනතුරු වැළැක්වීම සහ සේවක සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම, සුවපහසු සේවා පරිසරයක් නිර්මාණය කිරීම සහ සේවා ස්ථානයේ ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමට කටයුතු කරන්න.**

1. සේවකයින්ට සපයනු ලබන සේවා ස්ථාන ගොඩනැගිලි පහසුකම් සහ නවාතැන් සේවකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රමිතීන් සපුරාලිය යුතු අතර, එය දේශීය ගොඩනැගිලි කේත රෙගුලාසි මගින් අනුමත කර ඇති බවත් නිසි ලෙස පරීක්ෂා කර පරීක්ෂණය සමත් වී ඇති බවටත් සහතික කර ගන්න.

2. සේවා ස්ථානයේ සහ සේවකයින්ට ලබා දී ඇති නිවාසවල දේශීය නීතිමය ප්‍රමිතීන්ට අනුකූල වන හදිසි පිටවීමේ දොරටු, ආපදාවකදී ඉවත් වීමේ මාර්ග සහ සංඥා ස්ථාපනය කර, නිතිපතා ඒවා පරීක්ෂා කිරීම සහ ආපදාවකදී ඉවත් වීමේ අභ්‍යාස පවත්වන්න.
3. සේවකයින්ට ලබා දෙන නිවාසවල ප්‍රමාණවත් ජීවන පරිසරයක් තිබිය යුතු අතර ඔවුන්ගේ පෞද්ගලිකත්වය සහතික කිරීමට කටයුතු කරන්න.
4. සේවකයින්ට සනීපාරක්ෂක වැසිකිළි හා පානීය ජලය ලබා දෙන්න. වැඩ කරන කාලය තුළ භාවිතය සීමා නොකරන්න.
5. සේවකයින්ට ඔවුන්ගේ රැකියා ආරක්ෂිතව කිරීමට අවශ්‍ය ආරක්ෂක උපකරණ, උපදෙස් සහ පුහුණු ආදිය ලබා දෙන්න.
6. රසායනික ද්‍රව්‍ය නිසි ලෙස හසුරුවා ගබඩා කර, අනතුරු වළක්වා ගැනීමට සහ අනතුරක් සිදුවුවහොත් හානිය සීමා කිරීමට පියවර ගන්න.
7. ශාරීරිකව දුෂ්කර කාර්යයන් හඳුනාගෙන ඇගයීමට ලක් කළ යුතු අතර, වෘත්තීය තුවාල සහ රෝගාබාධ වැළැක්වීම සඳහා සුදුසු කළමනාකරණයක් ක්‍රියාත්මක කරන්න.
8. රැකියා ස්ථානයේදී අනතුරක් හෝ අසනීපයක් ඇති වුවහොත්, තත්වයන් හඳුනා ගැනීම, ඇගයීම, වාර්තා කිරීම සහ දැනුවත් කිරීම, සුදුසු ප්‍රති-පියවර සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්න.
9. සේවක ප්‍රතිලාභවලට අදාළ නීති සහ රෙගුලාසි පිළිපැද, සේවකයින්ට මානසික සහනයෙන් යුතුව වැඩ කිරීමට ඉඩ සලසන සේ සේවා තත්වයන් වැඩි දියුණු කරන්න.
10. ගැබ් ගැනීම, දරු ප්‍රසූතිය, දරුවන් රැකබලා ගැනීම ආදිය හේතුවෙන් වන අහිතකර සැලකිලි තහනම් කර, ශ්‍රම බලකායට සුදුසු වැඩ පරිසරයක් ලබා දීමට කටයුතු කරන්න.
11. සේවකයින්ගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා සුදුසු සෞඛ්‍ය පරීක්ෂණ පවත්වන්න.

## 9. ගෝලීය පාරිසරික සංරක්ෂණය

**අමුද්‍රව්‍ය ප්‍රසම්පාදනය, නිෂ්පාදනය සහ සැපයුම ඇතුළු සියලු අංශවලින් පරිසර හිතකාමී ආකාරයකින් ව්‍යාපාර කටයුතු පවත්වා ගනිමින් තිරසාර සමාජයක් සාක්ෂාත් කර ගැනීමට දායක වන්න**.

1. සියලුම රටවල සහ කලාපයන්හි පාරිසරික රෙගුලාසි සහ ජාත්‍යන්තර ගිවිසුම් පිළිපදින්න.
2. ජාත්‍යන්තර ගිවිසුම් හෝ නීති සහ රෙගුලාසි මගින් තහනම් කර ඇති රසායනික ද්‍රව්‍ය හෝ Seven & i අප සමූහයේ කිසිදු මෙහෙයුම් සමාගමක් විසින් තහනම් කර ඇති රසායනික ද්‍රව්‍ය භාවිතා නොකරන්න.
3. අපද්‍රව්‍ය, පිටාර ජලය සහ අපජලය නිසි ලෙස කළමනාකරණය කර පරිසර දූෂණය වළක්වන්න.
4. භාවිතා කරන ජල ප්‍රභවයන්, භාවිතය සහ බැහැර කිරීම නිරීක්ෂණය කර, ජලය සංරක්ෂණය කිරීම සහ සුදුසු අපජල පිරිපහදු ක්‍රම ක්‍රියාත්මක කිරීම ඇතුළුව ජල සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමට උත්සාහ කරන්න.
5. ඔබගේ ව්‍යාපාරයෙන් පරිසරයට සිදුවන බලපෑම නිසි ලෙස තේරුම් ගැනීමට උත්සාහ කරන්න.
6. ජෛව විවිධත්වයේ වැදගත්කම පිළිබඳව වටහාගෙන එය සංරක්ෂණය කිරීමට උත්සාහ කරන්න.

7. අප සමූහය සමාගම්වල මුල් නිෂ්පාදන හසුරුවන ව්‍යාපාරික හවුල්කරුවන්, Seven & i හෝල්ඩින් සමාගට එම සමූහයේ "GREEN CHALLENGE 2050" ඉලක්ක සපුරා ගැනීමට සහයෝගය ලබා දෙන්න.
    - කාබන් ඩයොක්සයිඩ් විමෝචනය අඩු කිරීම
    - 2050 වසර වන විට, මුල් නිෂ්පාදන බහාලුම් සඳහා 100% පරිසර හිතකාමී ද්‍රව්‍ය (ජෛව ස්කන්ධ, ජෛව හායනයට ලක්වන සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය, කඩදාසි ආදිය) භාවිතා කෙරේ
    - 2050 වන විට ආහාර අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ අනුපාතය 100%
    - 2050 වන විට, අපගේ මුල් නිෂ්පාදනවල ඇති සියලුම ආහාර ද්‍රව්‍ය 100% තිරසාර ද්‍රව්‍ය වලින් සාදනු ලැබේ
8. කරුණාකර පරිසර හිතකාමී තාක්ෂණයන් සංවර්ධනය කර ව්‍යාප්ත කර ඒවා ක්‍රියාකාරීව හඳුන්වා දීමට උත්සාහ කරන්න.

## 10. රහසිගත තොරතුරු පිටතට යාම වැළැක්වීම සහ තොරතුරු කළමනාකරණය කිරීම

**තොරතුරු වත්කම්වල "රහස්‍ය භාවය", "අඛණ්ඩතාවය" සහ "ලබා ගත හැකි බව" පවත්වා ගෙන යන්න. තොරතුරු දැනුවත්ව හෝ නොදැනුවත්ව පිටතට යාම, සොරකම් කිරීම, විකෘති කිරීම සහ විනාශ කිරීම වැනි තර්ජන වලින් ආරක්ෂා කරගන්න.**

1. තොරතුරු ආරක්ෂාව පවත්වා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් ස්ථාපිත කිරීම සහ භූමිකාවන් සහ වගකීම් නිර්වචනය කිරීම.
2. තොරතුරු ආරක්ෂාව පවත්වා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් ස්ථාපිත කර, භූමිකාවන් සහ වගකීම් තීරණය කරන්න.
3. තොරතුරු ආරක්ෂාවට අදාළ රෙගුලාසි ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම සිදුකර සියලුම සේවකයින්ට නිතිපතා ඉගැන්වීම් සහ පුහුණුව ලබා දෙන්න.
4. තොරතුරු ආරක්ෂක සිදුවීම් සහ අනතුරු සඳහා පෙර සූදානමක් ලෙස ඵලදායී පියවර ඉක්මනින් ගැනීම සඳහා පද්ධති සහ ක්‍රියා පටිපාටි ස්ථාපිත කරන්න.
5. ආපදා සහ අනතුරු සඳහා පෙර සූදානමක් ලෙස, ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් සකස් කර තොරතුරු වල ආරක්ෂාව සහතික කිරීමට උත්සාහ කරන්න.
6. තොරතුරු ආරක්ෂාව පිළිබඳ නීති සහ රෙගුලාසි සහ ගිවිසුම්ගත බැඳීම් පිළිපදින්න.
7. ස්වයං පරීක්ෂණ සහ අභ්‍යන්තර විගණන පවත්වා,තොරතුරු ආරක්ෂක රෙගුලාසි නිරීක්ෂණය කර, තොරතුරු ආරක්ෂාව සහතික කිරීම සඳහා සුදුසු කළමනාකරණ පියවර සහ ඵලදායී බව තහවුරු කර, අවශ්‍ය ඕනෑම නිවැරදි කිරීමේ පියවරක් ගන්න.
8. සේවකයින් සමාජ මාධ්‍ය භාවිතා කිරීම හේතුවෙන් සිදුවන තොරතුරු පිටතට යාම, මානව හිමිකම් උල්ලංඝනය කිරීම්, නීති විරෝධී ක්‍රියාකාරකම් ආදිය වැළැක්වීම සඳහා භාවිත කළමනාකරණ රෙගුලාසි ආදිය ස්ථාපිත කර පරිශීලකයින් දැනුවත් කිරීමට උත්සාහ කරන්න.

## 11. පෞද්ගලික තොරතුරු කළමනාකරණය

**පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම වැදගත් ව්‍යාපාරික සහ සමාජීය වගකීමක් වන අතර, සියලුම සේවකයින් මෙය තම වගකීමක් ලෙස සලකා ඔවුන්ගේ රාජකාරි නිසි ලෙස ඉටු කිරීමට ඉඩ සලස්වන්න.**

1. නිශ්චිත අරමුණක් සඳහා හැර වෙනත් කිසිදු අරමුණක් සඳහා පෞද්ගලික තොරතුරු භාවිතා නොකරන්න. නිශ්චිත අරමුණෙහි විෂය පථයෙන් ඔබ්බට තොරතුරු භාවිතා කිරීමට අවශ්‍ය නම් පුද්ගලයාගේ පූර්ව කැමැත්ත ලබා ගන්න.
2. පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් ස්ථාපිත කර භූමිකාවන් සහ වගකීම් පවරන්න.
3. සුදුසු පරිදි නීති සහ රෙගුලාසි වලට අනුකූලව පෞද්ගලික තොරතුරු ලබා ගැනීම, කළමනාකරණය කිරීම, භාවිතා කිරීම සහ සැපයීම සිදු කරන්න.
4. පෞද්ගලික තොරතුරු පිටතට යාමේ සිද්ධියක් හෝ අනතුරක් සිදුවුවහොත්, වහාම අදාළ බලධාරීන්ට සහ Seven & i සමූහ ව්‍යාපාරයේ සෑම මෙහෙයුම් සමාගමකම අදාළ නිළධාරීන්ට වාර්තා කර, හානිය පැතිරීම වැළැක්වීමට පියවර ගන්න.

## 12. තත්ත්ව පාලනය සහ සදාචාරාත්මක අනුකූලතාවය

**සමාජයට අගනා සහ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා දායක වීම සඳහා, ආරක්ෂිත, විශ්වාසදායක, නව්‍ය සහ උසස් තත්ත්වයේ සහ ගනුදෙනුකරුවන් තෘප්තිමත් කරන නිෂ්පාදන සහ සේවාවන් සැපයීමට උත්සාහ කරන්න. අවසාන පාරිභෝගිකයින්ට ආරක්ෂිත, සුරක්ෂිත සහ සදාචාරාත්මක නිෂ්පාදන සැපයීම සඳහා, කරුණාකර අප සමූහයේ සෑම මෙහෙයුම් සමාගමක්ම ඉල්ලා සිටින තත්ත්ව ප්‍රමිතීන් මෙන්ම පහත කරුණු පිළිපදින්න.**

1. නිෂ්පාදන සහ සේවා සඳහා අමුද්‍රව්‍ය ප්‍රසම්පාදනය, නිෂ්පාදනය, ප්‍රවාහනය, අවසාන පාරිභෝගිකයින්ට නිෂ්පාදන සැපයීමේ සහ ඒවා බැහැර කිරීමේ ක්‍රියාවලියේදී, මානව හිමිකම්වලට ගරු කිරීම, ආරක්ෂා කිරීම සහ සහන සැලසීම, රැකියා සහ සේවා කොන්දේසි සැලකිල්ලට ගනිමින් සහ ගෝලීය පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඔබේ වගකීම් ඉටු කරන්න.
2. නිෂ්පාදනය කරන රටෙහි සහ අලෙවි කරන රටෙහි ස්ථාපිත කර ඇති සියලුම තත්ත්ව සහ ලේබල් කිරීමේ ප්‍රමිතීන් පිළිපදින්න.
3. පාරිභෝගිකයාගේ දෘෂ්ටි කෝණයෙන් නිෂ්පාදන සහ සේවා සංවර්ධනය කර සපයා අවසාන පාරිභෝගිකයා තෘප්තිමත් කිරීම සඳහා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට උත්සාහ කරන්න.
4. නිෂ්පාදන සහ සේවා සංවර්ධනය කිරීමේදී සහ සැපයීමේදී ඉහළ ආචාර ධර්ම ප්‍රමිතීන් පවත්වා ගෙන නීති, රෙගුලාසි සහ සමාජ සම්මතයන් පිළිපදින්න.
5. නිෂ්පාදන සහ සේවා පිළිබඳ අවශ්‍ය තොරතුරු සුදුසු ලෙස සහ පහසුවෙන් තේරුම් ගත හැකි ආකාරයට අවසන් පාරිභෝගිකයින්ට ලබා දෙන්න.

6. දරුවන් ඉලක්ක කරගත් හෝ දරුවන්ට නිරාවරණය විය හැකි නිෂ්පාදන සහ සේවා ආරක්ෂිත විය යුතු අතර, දරුවන්ට මානසික, සදාචාරාත්මක හෝ ශාරීරික හානියක් සිදු නොවන ලෙසට වග බලා ගන්න.

## 13. දේශීය හා ජාත්‍යන්තර ප්‍රජාවන් සමඟ සම්බන්ධතාවය

**ව්‍යාපාර පවත්වාගෙන යන රටවල සහ කලාපවල මානව හිමිකම්, පරිසරය, සංස්කෘතිය, ආගම, සිරිත් විරිත් ආදියට ගරු කර, තිරසාර සමාජයක් සාක්ෂාත් කර ගැනීමට දායක වන්න.**

1. සංවාදයන් තුළින්, ජාත්‍යන්තර සහ දේශීය ප්‍රජාවන්හි විවිධ සමාජ ගැටලු අවබෝධ කර ගෙන, සහයෝගීතාවය, සම්බන්ධතා, ව්‍යාපාර ආදිය හරහා එම ගැටළු විසඳීමට දායක වන්න.
2. ප්‍රදේශවාසීන්ගේ පැවැත්මට සහ සෞඛ්‍යයට බාධා වන ව්‍යාපාරික කටයුතු සිදු නොකරන්න.
3. සමාජ විරෝධී බලවේග (සන්නද්ධ කණ්ඩායම්, අපරාධ සංවිධාන, ත්‍රස්තවාදී සංවිධාන, කල්ලි, කල්ලි සාමාජිකයින්, කල්ලි ආශ්‍රිත සමාගම් සහ සංවිධාන, ආයතනික ජාවාරම්කරුවන්, සමාජීය හෝ දේශපාලන ක්‍රියාකාරකම්වල නියැලී සිටින බව මවාපාන වංචාකරුවන්, විශේෂ බුද්ධි ප්‍රචණ්ඩ කණ්ඩායම් ආදිය) හෝ එම සමාජ විරෝධී බලවේග සමඟ සහජීවනයෙන් සිටින පුද්ගලයින් සමඟ කිසිදු සම්බන්ධයක් නොපවත්වන්න.
4. සමාජ විරෝධී බලවේග සමඟ සබඳතා නොපැවැත්වීමට පියවර ගෙන, සැපයුම්කරුවන් සහ අනෙකුත් ව්‍යාපාරික හවුල්කරුවන් සමාජ විරෝධී බලවේගවල සාමාජිකයන් නොවන බවට සහතික කර ගන්න. සමාජ විරෝධී බලවේග බැහැර කිරීම සඳහා කරුණාකර ඔබේ කොන්ත්‍රාත්තුවල අදාළ වගන්ති ඇතුළත් කරන්න.
5. ගනුදෙනු වලදී, සමාජ විරෝධී බලවේග සඳහා අරමුදල් සපයන මූලාශ්‍ර ආදිය බවට පත්විය හැකි ගැටුම් හෝ අපරාධවලට සම්බන්ධ නොවන්න.

## 14. දූෂණ විරෝධී සහ සාධාරණ ගනුදෙනු

**සාධාරණ, විනිවිද භාවයෙන් යුතු සහ නිදහස් තරඟකාරිත්වයක් සහ සුදුසු ව්‍යාපාරික ගනුදෙනුවල නිරත වී, දේශපාලනය සහ රජයේ ආයතන සමඟ සෞඛ්‍ය සම්පන්න සහ නිසි සබඳතා පවත්වා ගන්න.**

1. කප්පම් ලබා ගැනීම් සහ අල්ලස් ඇතුළු කිසිදු ආකාරයක දූෂිත ගනුදෙනුවක නිරත නොවන්න.
2. ව්‍යාපාර කටයුතු වලදී, නුසුදුසු, නීති විරෝධී හෝ විශ්වාසය කඩ කිරීමේ හැසිරීමක යෙදීමට කිසියම් පුද්ගලයෙකු පොළඹවන කිසිදු තෑග්ගක්, ණයක්, ස්තූති මුදලක්, වන්දියක් හෝ වෙනත් ප්‍රතිලාභයක් සෘජුව හෝ වක්‍රව පිරිනැමීම හෝ පිළිගැනීම නොකරන්න.
3. දූෂණ විරෝධී ප්‍රතිපත්තියක් සහ ඉගෙනුම් පද්ධතියක් ස්ථාපිත කරන්න.
4. නිදහස් හා සාධාරණ තරඟකාරිත්වයන්ට ගරු කරමින්, ඒකාධිකාරී විරෝධී පනත සහ අනෙකුත් නීති සහ රෙගුලාසි මෙන්ම සමාගම් නීතිරීති සුරකින්න.
5. ව්‍යාපාර කටයුතු වලදී, හොඳ ව්‍යාපාරික පිළිවෙත් අනුගමනය කරන්න. කිසිදු පුද්ගලික වාසියක් නොගෙන සාධාරණ කොන්දේසි යටතේ ගනුදෙනු සිදු කරන්න.

6. එක් එක් රටවල නීති සහ රෙගුලාසිවලට අනුකූලව දේශීය හා විදේශීය රාජ්‍ය නිලධාරීන්ට සහ ඒ හා සමාන තත්වයේ පුද්ගලයන්ට දේශපාලන පරිත්‍යාග සහ ත්‍යාග, විනෝදාස්වාදය සහ මූල්‍යමය ප්‍රතිලාභ පිරිනැමීමෙන් දේශපාලනය සහ රජය සමඟ සාධාරණ සම්බන්ධතාවයක් පවත්වා ගන්න.

## 15. බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම

1. ඔබේ සමාගම සතු හෝ එයට අයත් බුද්ධිමය දේපළ අයිතිවාසිකම් තෙවන පාර්ශවයන් විසින් උල්ලංඝනය කිරීමෙන් ආරක්ෂා කරගැනීම පිළිබඳව සැලකිලිමත් වන්න.
2. පේටන්ට් බලපත්‍ර, උපයෝගිතා ආකෘති, සැලසුම්, වෙළඳ ලකුණු, ප්‍රකාශන හිමිකම් සහ වෙළඳ රහස් වැනි තෙවන පාර්ශවීය බුද්ධිමය දේපළ අනවසරයෙන් අත්පත් කර ගැනීම හෝ භාවිතය, මෘදුකාංග අනවසරයෙන් භාවිතා කිරීම, පොත් හෝ වෙනත් මාධ්‍ය තොරතුරු අනවසරයෙන් පිටපත් කිරීමෙන් හෝ වෙනත් ඕනෑම අයිතිවාසිකම් උල්ලංඝනයකින් වළකින්න.

## 16. ආනයන අපනයන කළමනාකරණය

1. නිෂ්පාදන, අමුද්‍රව්‍ය ආදිය ආනයනය සහ අපනයනය සම්බන්ධයෙන් සියලුම නීති සහ රෙගුලාසි පිළිපදින්න.
2. නිෂ්පාදන සහ අමුද්‍රව්‍ය සඳහා අරමුදල් සහ ද්‍රව්‍ය සපයන හෝ ශ්‍රමය වෙනුවට වන්දි ලෙස වැටුප් සැපයීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර ආර්ථික සම්බාධකවලට යටත් වන රටවල්, කලාප, සංවිධාන සහ පුද්ගලයින් සමඟ කිසිදු සම්බන්ධතාවයක් නොපවත්වන්න.
3. ඔබේ නිෂ්පාදනවල අඩංගු අමුද්‍රව්‍ය ගැටුම්වලින් පීඩාවට පත් හෝ අධි අවදානම් සහිත ප්‍රදේශවල බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම්, පාරිසරික විනාශය, දූෂණය, ගැටුම් ආදියට හේතු වේද නැතහොත් දායක වේද යන්න සොයා බලන්න.

## 17. වාර්තාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම

**සමාගම තුළ සහ පිටත සිට සංවිධානාත්මක හෝ පුද්ගල විෂමාචාර සම්බන්ධයෙන් වාර්තා සහ උපදේශන නිසි ලෙස හැසිරවීම සඳහා පද්ධතියක් හඳුන්වා දී, මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ විෂමාචාර වැළැක්වීම, කල්තියා හඳුනා ගැනීම සහ නිවැරදි කිරීම මගින් මානව හිමිකම් හොඳින් ආරක්ෂා කිරීමට සහ රෙගුලාසි පිළිපැදීමට උත්සාහ කරන්න.**

**තවද, දැනුම් දීමක් නිසා අදාල පාර්ශවය කිසිදු පළිගැනීමකට ලක් නොවන පරිදි අයථා ක්‍රියා දැනුම් දෙන්නන් ආරක්ෂා කරන්න.**

## 18. ආපදා වැළැක්වීමේ පියවර

**ස්වාභාවික විපතක් ඇතිවීමේ හැකියාව පුරෝකථනය කර, සේවකයින්ගේ සහ ප්‍රදේශවාසීන්ගේ ආරක්ෂාවට ප්‍රමුඛතාවය ලබා දී හානිය අවම කිරීමට පියවර ගන්න. තවද, ව්‍යාපාර අඛණ්ඩතාව හෝ ඉක්මනින් යථා තත්ත්වයට පත් කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් සකස් කර, ව්‍යාපාර වත්කම්වලට සිදුවන හානිය අවම කර ගැනීමට**

**නිතිපතා සමාකරණ පවත්වා සැලැස්ම සමාලෝචනය කරන්න.**

## 19. සැපයුම් දාමය දක්වා පුළුල් කිරීම

**ව්‍යාපාරික හවුල්කරුවන්ගේ සැපයුම්කරුවන්ට මෙම මාර්ගෝපදේශ අවබෝධ කර ගැනීම සහ බෙදා හැරීම ප්‍රවර්ධනය කර, අවශ්‍ය පරිදි සුදුසු සහාය සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ලබා දෙන්න.**

## 20. අධීක්ෂණය

**අධීක්ෂණයේ අරමුණ වන්නේ, "පාරිභෝගිකයින්ට සුරක්ෂිත බව සහ ආරක්ෂාව සැපයීම", "ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ සහජීවනය සහ සමෘද්ධිය" සහ "මෙම මාර්ගෝපදේශ ප්‍රවර්ධනය කිරීම" යි. අධීක්ෂණය සඳහා ඔබගේ සහයෝගය බලාපොරොත්තු වෙමු.**

1. මෙම මාර්ගෝපදේශවලට අනුකූල වීම සත්‍යාපනය කිරීම සඳහා පවත්වනු ලබන ඕනෑම අධීක්ෂණයක් සමඟ සහයෝගයෙන් කටයුතු කරන්න.
2. මෙම මාර්ගෝපදේශය පිළිපදින බව පෙන්නුම් කිරීම සඳහා ලියකියවිලි සහ ක්‍රියාත්මක කිරීමේ වාර්තා සකස් කර, නිසි ලෙස ගබඩා කරන්න.
3. කරුණාකර අප සමූහය විසින් ඉල්ලුම් කරන හෙළිදරව් කිරීම හෝ බෙදා ගැනීම සඳහා වන ඕනෑම ඉල්ලීමකට එකඟ වන්න.
4. අධීක්ෂණයේදී මෙම මාර්ගෝපදේශ පිළිනොපදින බව අනාවරණය වුවහොත්, තත්ත්වය වැඩිදියුණු කිරීමට සහ නිවැරදි කිරීමට උත්සාහ කරන්න.

නිමි

2007 මාර්තු මාසයේදී ස්ථාපිත කරන ලදී
2017 අප්‍රේල් මාසයේ සංශෝධනය කරන ලදී
2019 දෙසැම්බර් මස සංශෝධනය කරන ලදී
2025 මාර්තු මස සංශෝධනය කරන ලදී
2025 සැප්තැම්බර් මස සංශෝධනය කරන ලදී